# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,923 - 2015 ජූලි මස 10 වැනි සිකුරාදා - 2015.07.10**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 1002 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 1007 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | 1014 |

| | පිටුව |
|---|---|
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |


*සැ. යු.-* දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත, 2015 මාර්තු මස 13 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මීන් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ***ගැසට් පත්‍රය*** **පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 ජූලි මස 30 දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 ජූලි මස 17 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


1001 - B 80964— 5,352 (2015/07)
F 1 –

# තනතුරු - ඇබෑර්තු

## කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව

### මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ තනතුරු පුරප්පාඩු

කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරුවලට සුදුසුකම් ඇති කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු. අංකය | තනතුරු නාමය | පුරප්පාඩු ගණන | අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම් | වැටුප් පරිමාණය | බඳවා ගැනීම |
|---|---|---|---|---|---|
| 01 | සෞඛ්‍ය කම්කරු | 04 | අවම වශයෙන් 08 වසර/ 09 ශ්‍රේණිය සමත්ව සිටිය යුතුයි. | PL-1 2006A රු. 11,730 - 10 x 120 -10 x 130 - 10 x 145 -12 x 160 - රු. 17,600 | වාචික පරීක්ෂණය |
| 02. | පුස්තකාල සහායක | 02 | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් එක් වරකදී කවර හෝ විෂයයන් 06 ක් සමත් විය යුතුයි. | PL-1 2006A රු. 11,730 - 10 x 120 -10 x 130 - 10 x 145 -12 x 160 - රු. 17,600 | වාචික පරීක්ෂණය |

01. *බඳවා ගැනීමේ පොදු කොන්දේසි .-*

(i) ශ්‍රී ලාංකිකයෙකු විය යුතුයි

(ii) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවුරුදු 18ට නොඅඩු 45ට නොවැඩි විය යුතුයි. දැනට රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක යෙදී සිටින අයට උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

(iii) කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යටත් පිරිසෙයින් අවුරුදු 03ක ස්ථිර පදිංචිය ඇති අයෙකු විය යුතුයි. (ඡන්ද හිමි නාම ලේඛනය හෝ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන සහතිකයක් මගින් එය සනාථ කළ යුතුයි.)

(iv) කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන් සඳහා වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

(v) යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුයි.

(vi) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවකු නොවිය යුතුයි.

(vii) රජයේ හෝ පළාත් පාලන සේවයේ පහ කරනු නොලැබූ අයෙකු විය යුතුයි.

(viii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 44/90 යටතේ විශ්‍රාම ලැබූවකු නොවිය යුතුයි.

(ix) දැනට කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාවේ අනියම්/ආදේශක/තාවකාලික/කොන්ත්‍රාත්/ස්වේච්ඡා/ස්ථිර පදනම මත සේවයේ යෙදෙන සේවකයන් සම්බන්ධයෙන් විශේෂයෙන් සලකා බලනු ලැබේ.

(x) අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතර කාලසීමාවේ දී මධ්‍යම පළාතේ මෙම තනතුරුවලට අදළව නව බඳවාගැනීම් පරිපාටි ව්‍යවස්ථා සංශෝධනය වීම සහ ව්‍යවස්ථා ආදේශ කිරීම ද, බඳවා ගැනීම් ප්‍රමාද කිරීම, වෙනස් කිරීම සහ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු ය.

*02. සේවා නියුක්ති කරවීමේ කොන්දේසි .-*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ. ස්ථිර සේවකයින් අවුරුදු 01 ක පරිවාස කාලයකට යටත් වේ.

(ii) වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දයක විය යුතුයි.

(iii) රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට එකග විය යුතුයි.

(iv) මෙම බඳවාගැනීමේ කොන්දේසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලටද/රජයේ මුදල් රෙගුලාසි වලටද/රජයේ දෙපාර්තමේන්තු නියෝගවලටද/මධ්‍යම පළාත් සභාව හෝ කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව විසින් වරින් වර නිකුත් කරනු රෙගුලාසි හා නියෝගවලට අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුයි.

03. සුදුසුකම් ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර පහත සඳහන් ලිය කියවිලි වල ඡායා පිටපත් අමුණා එවිය යුතුයි

(i) උප්පැන්න සහතිකය,
(ii) අධ්‍යාපන සහතික,
(iii) ජාතිකක හැඳුනුම්පත් ඡායා පිටපතක්,
(iv) පදිංචිය පිළිබඳ ප්‍රාදේශීය ලේකම්ගේ සහතිකය,
(v) මෑතකදී ලබාගත් චරිත සහතික 02 ක් (මින් 01 ක් ග්‍රාම නිලධාරියාගෙන් ලබා ගත යුතුය),
(vi) පළපුරුද්ද පිළිබඳ සහතිකය,
(vii) වෙනත් සුදුසුකම් පිළිබඳ සහතික.

04. වෘත්තීය තොරතුරු සමඟ සම්පූර්ණ ජීව දත්ත ඇතුළත් පහත සඳහන් පරිදි සකසා ගත් අයදුම්පතක් අදළ සියලුම සහතිකවල පිටපත් ද සමගින් 2015.07.20 දින හෝ එදිනට පෙර පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාරදිය යුතුයි.

05. අයදුම්පත්‍ර බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි ඉල්ලුම් කරන තනතුරෙහි නම සඳශන් කළ යුතුය.

06. දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයෙහි නියුතු අයදුම්කරුවන් තම ඉල්ලුම්පත් ආයතන ප්‍රධානියාගේ නිර්දේශ සහිතව එවිය යුතුය.

07. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

ජී. යූ. ගුණසිංහ,
ලේකම්,
කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව,
මැණික්හින්න

2015 ජුනි මස 24 වැනි දින.

**කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාවේ .................................... තනතුර සඳහා අයදුම්පත්‍රය**

1. මුලකුරු සමඟ නම :————————
   (i) මුලකුරු වලින් හැඳින්වෙන නම්:————————
2. ස්ථිර ලිපිනය:————————
3. උපන් දිනය : අවුරුද්ද :———— මාසය:———— දිනය:————
4. ජාතික හැඳුනුම්පත් අංකය: | | | | | | | | | | |
5. ස්ත්‍රී/පුරුෂ භාවය:————————
6. දුරකථන අංකය : | | | | | | | | | | |
7. විවාහක/අවිවාහක බව:————————
8. අධ්‍යාපන සුදුසුකම් :

8.1 අයදුම්කරුවන් අවසන් වරට සමත් වූ පන්තිය සිංහල :————
දෙමළ :————

8.2 අ.පො.ස. (සා/පෙළ) විභාගය :
(i) වර්ෂය:———— මාසය:————
(ii) විභාග අංකය:————
(iii) ප්‍රතිඵල

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

8.3 අ.පො.ස (උ/පෙළ) විභාගය :

(i) වර්ෂය:————— මාසය:—————

(ii) විභාග අංකය:—————

(iii) ප්‍රතිඵල:

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

09. වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද:————————————

10. වෙනත් සුදුසුකම් :————————————

11. ඔබ කවරදක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබ තිබේද?:—————————————

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳව කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරු දන්වා ඇති බව ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම් ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමටද යටත් වන බව ද මම දනිමි.

—————

අයදුම්කරුගේ අත්සන.

දිනය:—————

*දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය*

(රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ/ රජයේ සංස්ථා /ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි) මෙම ආයතනයේ .......... තනතුර දරන...........මයා/මෙනවියගේ අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි. ඔහුගේ/ඇයගේ වැඩ හැසිරීම සතුටුදායක බවත්, විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බවත්, ඒ පිළිබඳව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත්, සහතික කරමි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් දැනට යෙදෙන සේවයෙන් නිදහස් කළ හැකි බවත්/නොහැකි බවත් සහතික කරමි.

—————

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා නිලමුද්‍රාව.

දිනය:—————

07- 444

---

## වත්තල ප්‍රාදේශීය සභාව

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ වත්තල ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩුව පවතින මෙම නිවේදනයේ සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා සුදුසුකම් ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|
| 01 | ආදායම් පරීක්ෂක | MN1 2006A - රු. 13,120 - 10 x 145 - 11 x 170 - 10 x 240 - 10 x 320 - රු. 22,040 | *බාහිර අයදුම්කරුවන් සඳහා :*<br>සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සමත් වී තිබීම.;<br>*සහ*<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) (සමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත් වී තිබීම. |

| අනු. අංකය | තනතුරු නාමය | වැටුප් ක්‍රමය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|
| 02. | ආයුර්වේද ඖෂධ සංයෝජක | PL2 2006A - රු.12,210 - 10 x 130 - 10 x 145- 10 x 160 -12 x 170 - රු. 18,600 | *බාහිර අයදුම්කරුවන් සඳහා :* අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් 06 කින් සමත් වීම (මින් විෂයයන් 5ක් එකවර සමත්ව තිබිය යුතුය; *සහ* රජයේ ආයුර්වේද බෙහෙත් ශාලාවක හෝ රජය මගින් පිළිගත් ආයුර්වේද බෙහෙත් ශාලාවක වසරකට නොඅඩු කාලයක ක්ෂේත්‍රයට අදාළ සේවා පළපුරුද්දක් ලබා තිබීම. |

***ආදයම් පරීක්ෂක තනතුරට බඳවා ගැනීමේ ක්‍රමය*** .- අභියෝගතාවය හා බුද්ධි පරීක්ෂණය/සාමාන්‍ය දැනීම විෂයයන් වලින් සමන්විත ලිඛිත විභාගයක් මගින් -

***ආයුර්වේද ඖෂධ සංයෝජක තනතුරට බඳවා ගැනීමේ ක්‍රමය*** - ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් :

*බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි :*

- * අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය;
- * විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය;
- * අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පූර්වාසන්නයේ අවම වශයෙන් වසර 03 ක් බස්නාහිර පළාත තුළ අඛණ්ඩ ස්ථිර පදිංචියක් ඇති අයෙකු විය යුතුය;
- * ආදායම් පරීක්ෂක තනතුරට අයදුම් කළ අයදුම්කරුවන් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවු. 18 ත් 30 ත් අතර විය යුතු අතර, ආයුර්වේද ඖෂධ සංයෝජක තනතුරට අයදුම් කල අයදුම්කරුවන් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවු. 18 ත් 45ත් අතර විය යුතුය;
- * දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබූවෙකු හෝ රාජ්‍ය හෝ පළාත් පාලන සේවයෙන් පහ කරනු නොලැබූවෙකු හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 44/90 යටතේ විශ්‍රාම නොලැබූ අයෙකු විය යුතුය.

*සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

- * මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිත ය;
- * තෝරා ගනු ලබන්නන් අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වේ;
- * වැන්දඹු හා වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය;
- * පරිවාස කාලය තුළදී පැමිණීම, වැඩ, හැසිරීම, සතුටුදායක වන්නේ නම් පරිවාස කාලය අවසානයේ සේවය ස්ථිර කරනු ලැබේ.
- * මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අනුකූලව ශ්‍රී ලංකා ජනරජයේ නියෝගවලට ද බස්නාහිර පළාත් සභාව හෝ බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ වත්තල ප්‍රාදේශීය සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන රෙගුලාසි හා නියෝගවලටද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.

*අයදුම්පත් සමඟ එවිය යුතු සහතික පිටපත් .-*

- * උප්පැන්න සහතිකය;
- * අධ්‍යාපන සහතිකය;
- * ජාතික හැඳුනුම්පතේ පිටපතක්;
- * ප්‍රාදේශීය ලේකම් අනු අත්සන සහිත ග්‍රාම නිලධාරී විසින් නිකුත් කළ පදිංචිය පිළිබඳ සහතිකය;
- * මෑතකදී ලබාගත් චරිත සහතික 02 ක් (එක් සහතිකයක් ප්‍රදේශයේ ග්‍රාම නිලධාරිගෙන් ලබාගත් එකක් විය යුතුය;
- * වෙනත් සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතික.

*අයදුම්පත් එවිය යුතු ආකාරය :*

- * මෙම නිවේදනයේ දක්වෙන ආදර්ශ අයදුම්පත්‍රය අනුව අඟල් 12 x 8 ප්‍රමාණයේ තමා විසින් පිළියෙල කරගත් අයදුම්පත් 2015.07.20 දිනයට හෝ ඊට පෙර "ලේකම්, වත්තල ප්‍රාදේශීය සභාව, වෙළඳ සංකීර්ණය, කෙරවලපිටිය, හැඳල, වත්තල", යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය;
- * අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදළ තනතුර සඳහන් කළ යුතුය;
- * දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ අයදුම්පත් තම ආයතන ප්‍රධානියාගේ නිර්දේශයෙන් එවිය යුතුය;
- * අතින් ගෙනවිත් දෙන අයදුම්පත් භාර ගනු නොලබන අතර, ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සැලකිය යුතුයි :

මෙම අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුර කාලසීමාවේදී මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම, වෙනස් කිරීම, මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම වත්තල ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය. එමෙන්ම ඉහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

කේ. එච්. එස්. අයිරාංගනී,
ලේකම්,
වත්තල ප්‍රාදේශීය සභාව.

2015 ක් වූ ජුනි මස 19 වැනි දින,
වත්තල ප්‍රාදේශීය සභාවේ දී ය.

**ආදර්ශ අයදුම්පත**

***වත්තල ප්‍රාදේශීය සභාව***

———————————— තනතුර සඳහා වූ අයදුම්පත්‍රය

1. (අ) මුලකුරු සමග නම :——————————————
   (ආ) මුලකුරු වලින් හැඳින්වෙන නම් :——————————————
2. පෞද්ගලික ලිපිනය :——————————————
3. දුරකථන අංකය :——————————————
4. උපන් දිනය :——————————————
   වර්ෂය:—————— මාසය:—————— දිනය:——————
5. බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිය :——————————————
6. (අ) ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක්ද? :——————————————
   (ආ) එසේ නම් පරම්පරාවෙන්ද? ලියාපදිංචියෙන්ද? :——————————————
7. ස්ත්‍රී/පුරුෂ භාවය :——————————————
8. විවාහක/අවිවාහක බව :——————————————
9. අධ්‍යාපන සුදුසුකම්/සමත් වී ඇති ඉහලම විභාගය:——————————————
10. (අ) පළපුරුද්ද සහ වෘත්තීය සුදුසුකම්:——————————————
    (ආ) වෙනත් සුදුසුකම්:——————————————
11. (අ) ඔබට කුමන හෝ වරදකට අධිකරණයකින් දඬුවම් පනවා තිබේද?:——————
    (ආ) එසේ නම් දඬුවමේ ස්වභාවය :——————
12. ඔබ දැනට මෙම සභාවේ සේවය කරන්නේ නම් සේවා කාලය, සේවා විස්තරය හා තනතුරේ ස්වභාවය:——————
    (අනියම්, ස්ථිර නොවන ආදේශක, ගිවිසුම් පදනම් මත, ව්‍යාපෘති පදනම)

මෙම ඉල්ලුම් පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත් නිවැරදි වූත් ඒවා බව සහතික කරමි. මෙහි ඇතුලත් තොරතුරු අසත්‍ය හෝ වැරදි බව අනාවරණය වුවහොත් මෙම තනතුරට මා තෝරා ගැනීමට නුසුදුස්සෙකු බවට පත්වන බවත්, තෝරා ගැනීමෙන් පසු දැනගතහොත් වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත්, මම දනිමි.

——————,
අයදුම්කරුගේ අත්සන.

දිනය:——————

*දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු වන ..............................................මහතා/මහත්මිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ...........දින සිට ............දින දක්වා .............වශයෙන් සේවය කරයි. ඔහු/ඇය සේවයෙන් මුදහල හැක/නොහැක. ඔහු/ඇය මොනයම් ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීමක් හැර) භාජනය වී නොමැති බව මෙයින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

——————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව තබන්න.)

දිනය :——————

07-522

# පළාත් පාලන නිවේදන

## කඩුවෙල මහ නගර සභාව

1989 අංක 12 පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 252 වැනි අධිකාරය වූ මහ නගර සභා ආඥාපනතේ 71(1) වැනි වගන්තිය යටතේ බස්නාහිර පළාතේ පළාත් පාලන විෂයභාර ගරු අමාත්‍යතුමා විසින් පහත දක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති පාර "සිසිල උයන" යනුවෙන් නම් කරනු ලැබ ඇති බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ජී. ලේඛා ගීතාංජලී,
නාගරික කොමසාරිස්,
කඩුවෙල මහ නගර සභාව.

කඩුවෙල මහ නගර සභාවේ දී ය.

උපලේඛනය

| | | | |
|---|---|---|---|
| 1. | පළාත් පාලන ආයතනයේ නම | : | කඩුවෙල මහ නගර සභාව |
| 2. | දිස්ත්‍රික්කය | : | කොළඹ |
| 3. | ග්‍රාම නිලධාරී කොට්ඨාසය | : | 477සී - පොතුඅරාව |
| 4. | වීථියේ වර්තමාන නම | : | නැත |
| 5. | අලුතින් යොද ඇති නම | : | සිසිල උයන |
| 6. | මාර්ග විස්තර: | | |

(i) මාර්ගයේ ආරම්භය :

| | | |
|---|---|---|
| වම්පස | : | පොතුඅරාව මාර්ගයේ දකුණුපස වරිපනම් අංක 45 දරන දේපළ |
| දකුණුපස | : | පොතුඅරාව මාර්ගයේ දකුණුපස වරිපනම් අංක 43 දරන දේපළ |

(ii) මාර්ගයේ අවසානය :

| | | |
|---|---|---|
| වම්පස | : | නම් කිරීමට යෝජිත මාර්ගයේ වරිපනම් අංක 43/8 දරන දේපළ |
| දකුණුපස | : | නම් කිරීමට යෝජිත මාර්ගයේ වරිපනම් අංක 43/18 දරන දේපළ |

07-333/1

---

## කඩුවෙල මහ නගර සභාව

1989 අංක 12 පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 252 වන අධිකාරය වූ මහා නගර සභා ආඥාපනතේ 71 (1) වන වගන්තිය යටතේ බස්නාහිර පළාතේ පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යතුමා විසින් පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති පාර "රයිගම මාවත" යනුවෙන් නම් කරනු ලැබ ඇති බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ජී. ලේඛා ගීතාංජලී,
නාගරික කොමසාරිස්,
කඩුවෙල මහ නගර සභාව.

කඩුවෙල මහ නගර සභාවේ දී ය.

උපලේඛනය

| | | | |
|---|---|---|---|
| 01. | පළාත් පාලන ආයතනයේ නම | : | කඩුවෙල මහ නගර සභාව |
| 02. | දිස්ත්‍රික්කය | : | කොළඹ |
| 03. | ග්‍රාම නිලධාරී කොට්ඨාසය | : | 488 කොරතොට |
| 04. | වීථියේ වර්තමාන නම | : | නැත |
| 05. | අලුතින් යොදා ඇති නම | : | රයිගම මාවත |

06. මාර්ග විස්තරය :

(i) මාර්ගයේ ආරම්භය

| | | |
|---|---|---|
| වම්පස | : | එම්. ඩී. එච්. ජයවර්ධන මාවතේ දකුණුපස වරිපනම් අංක 582 දරන දේපළ |
| දකුණුපස | : | එම්. ඩී. එච්. ජයවර්ධන මාවතේ දකුණුපස වරිපනම් අංක 578 දරන දේපළ |

(ii) මාර්ගයේ අවසානය

| | | |
|---|---|---|
| වම්පස | : | නම් කිරීමට යෝජිත මාර්ගයේ වරිපනම් අංක 578/22 දරන දේපල |
| දකුණුපස | : | නම් කිරීමට යෝජිත මාර්ගයේ වරිපනම් අංක 578/23 හා 578/25 දරන දේපල |

07-333/2

---

## කඩුවෙල මහ නගර සභාව

1989 අංක 12 පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමඟ කියවිය යුතු 252 වැනි අධිකාරය වූ මහ නගර සභා ආඥාපනතේ 71(1) වැනි වගන්තිය යටතේ බස්නාහිර පළාතේ, පළාත් පාලන විෂයභාර ගරු අමාත්‍යතුමා විසින් පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති පාර "කිරිබත්ගලවත්ත පාර" යනුවෙන් නම් කරනු ලැබ ඇති බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ජී. ලේඛා ගීතාංජලී,
නාගරික කොමසාරිස්,
කඩුවෙල මහ නගර සභාව.

කඩුවෙල මහ නගර සභාවේ දී ය.

### උපලේඛනය

| | | | |
|---|---|---|---|
| 01. | පළාත් පාලන ආයතනයේ නම | : | කඩුවෙල මහ නගර සභාව |
| 02. | දිස්ත්‍රික්කය | : | කොළඹ |
| 03. | ග්‍රාම නිලධාරි කොට්ඨාසය | : | 476, මාලබේ නැගෙනහිර |
| 04. | වීථියේ වර්තමාන නම | : | කිරිබත්ගලවත්ත පාර |
| 05. | අලුතින් යොදා ඇති නම | : | කිරිබත්ගලවත්ත පාර (මෙම මාර්ග නම් කිරීම මීට පෙර නීත්‍යානුකූල කර නොමැත) |
| 06. | මාර්ග විස්තරය : | | |

(i) මාර්ගයේ ආරම්භය :

| | | |
|---|---|---|
| වම්පස | : | කඩුවෙල-මාලබේ මාර්ගයේ වම්පස වරිපනම් අංක 295 දරන දේපළ |
| දකුණුපස | : | කඩුවෙල-මාලබේ මාර්ගයේ වම්පස වරිපනම් අංක 297 දරන දේපළ |

(ii) මාර්ගයේ අවසානය :

| | | |
|---|---|---|
| වම්පස | : | නම් කිරීමට යෝජිත මාර්ගයේ වම්පස වරිපනම් අංක 93 දරන දේපළ |
| දකුණුපස | : | නම් කිරීමට යෝජිත මාර්ගයේ දකුණුපස වරිපනම් අංක 92 දරන දේපළ |

07-333/3

---

## කඩුවෙල මහ නගර සභාව

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 252 වැනි අධිකාරය වූ මහ නගර සභා ආඥාපනතේ 71(1) වැනි වගන්තිය යටතේ බස්නාහිර පළාතේ පළාත් පාලන විෂයභාර ගරු අමාත්‍යතුමා විසින් පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති පාර "සපුමල් පෙදෙස" යනුවෙන් නම් කරනු ලැබ ඇති බැව් නිවේදනය කරනු ලැබේ.

ජී. ලේඛා ගීතාංජලී,
නාගරික කොමසාරිස්,
කඩුවෙල මහ නගර සභාව.

කඩුවෙල මහ නගර සභාවේ දී ය.

උපලේඛනය

1. පළාත් පාලන ආයතනයේ නම : කඩුවෙල මහ නගර සභාව
2. දිස්ත්‍රික්කය : කොළඹ
3. ග්‍රාම නිලධාරි කොට්ඨාසය : 477 සී - පොතුඅරාව
4. වීථියේ වර්තමාන නම : නැත
5. අලුතින් යොදා ඇති නම : සපුමල් පෙදෙස
6. මාර්ග විස්තර

(i) මාර්ගයේ ආරම්භය :
වම්පස : පොතුඅරාව මාර්ගයේ වරිපනම් අංක 52/ඒ දරන දේපළ
දකුණු පස : පොතුඅරාව මාර්ගයේ වරිපනම් අංක 50 දරන දේපළ

(ii) මාර්ගයේ අවසානය :

වම්පස : නම් කිරීමට යෝජිත මාර්ගයේ වරිපනම් අංක 54/2 දරන දේපළ
දකුණුපස : නම් කිරීමට යෝජිත මාර්ගයේ වරිපනම් අංක 50/10 දරන දේපළ

07-333/4

---

**1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත**

උතුරු මැද පළාත් සභා පරිපාලන ප්‍රදේශයේ නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව විසින් 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 03 වන වගන්තිය 2015 ජුනි මස 19 දින තීරණ අංක 09 යටතේ පළ කරනු ලැබේ.

යෝජනාව

1952- අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ 02 වන වගන්තිය යටතේ පළාත් පාලන නිවාස හා ඉදිකිරීම් අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබූ 1988 අගෝස්තු මස 23 දින අංක 520/07 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද්දාවූද, උතුරු මැද පළාත් සභාවේ යෝජනාවකින් අනුමත කළ බව 1992.02.28 දින අංක 704 දරන *ගැසට් පත්‍රයේ* (IV කොටසේ) පළවූ නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරන ලද්දාවූ ද, පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 1 කොටසේ සහ II වන කොටසේ අංක 01 සිට 42 දක්වා වූ කොටසේ මෙම යෝජනාව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* (IV කොටසේ) පළ කරනු ලබන දින සිට නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ බල පැවැත්විය යුතු අතුරු ව්‍යවස්ථා විය යුතු යැයි නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව විසින් 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 03 වන වගන්තියේ (1) උපවගන්තියට අනුව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 22 (අ) වගන්තිය සමග කියවිය යුතු 122 සහ 126 යන වගන්ති වලින් ලැබී ඇති බලතල ප්‍රකාර මෙයින් යෝජනා කරනු ලැබේ.

ලේකම්,
නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව,
විජයපුර.

2015 ජුනි මස 19 වැනි දින,
නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

07-363

---

**මීගමුව මහ නගර සභාව**

2015 වර්ෂයේ අංක 02 පරිපූරක අයවැය ලේඛනය

මීගමුව මහ නගර සභාවේ 2015.07.02 දින පැවැත්වීමට නියමිත මහ සභා රැස්වීමට ඉදිරිපත් කිරීම සඳහා 2015 වර්ෂයේ අංක 02 දරන පරිපූරක අයවැය ලේඛනය 2015.06.26 දින සිට දින 07 ක් මහජන පරීක්ෂණය සඳහා මෙම කාර්යාලයේ තබා ඇති බව 252 අධිකාරිය මහ නගර සභා ආඥා පනතේ 214(බී) යටතේ දැනුම් දෙමි.

ඇන්ටනි ජයවීර,
නගරාධිපති,
මහ නගර සභාව,
මීගමුව.

07-484

## කෑගල්ල ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(3) ආ වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1989 අංක 12 දරන (අනුෂාංගික විධි විධාන) පනතේ දෙවෙන වගන්තිය සමඟ කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) ආ වගන්තිය ප්‍රකාරව කටයුතු කරමින් 24(1) ආ වගන්තිය ප්‍රකාරව 2014.03.27 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ IV (ආ) කොටසෙහි ප්‍රකාශයට පත් කරන ලද පහත සඳහන් උපලේඛනයේ සඳහන් මාර්ග කෑගල්ල ප්‍රාදේශීය සභාව සතු මාර්ග ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එස්. ඒ. එස්. එම්. වික්‍රමසූරිය,
ලේකම්,
කෑගල්ල ප්‍රාදේශීය සභාව,
බුළුරුප්ප - හෙට්ටිමුල්ල.

| | | |
|---|---|---|
| පාරේ නම | : | කවුඩුගම වෙලමැදින් දිවෙන සමගි මාවත |
| වසම | : | 53 ඒ කවුඩුගම |
| දිග | : | මීටර් 103.0 |
| පළල | : | මීටර් 3.125 |

*පාරේ වම්පස*


| | | |
|---|---|---|
| 1. | ආර්. ඉදුනිල් අබේරත්න | සී 88/1බී කවුඩුගම |
| 2. | ඩබ්. ඒ. සිරිරත්න | සී/116 කවුඩුගම |
| 3. | ඩබ්. ඒ. ජානක චමින්ද බණ්ඩාර | සී/118 කවුඩුගම |
| 4. | පී. ජී. ආර්. ලලිත් කරුණාතිස්ස | සී/88 ඒ කවුඩුගම |
| 5. | පී. ජී. ආර්. නිහාල් කරුණාරත්න | සී/88 2ඒ කවුඩුගම |

*පාරේ දකුණුපස*

1. ගුත්තෑපාන සෝමරත්න හිමි රජමහා විහාරය, කවුඩුගම, හෙට්ටිමුල්ල

P.C. Jayasena (MSI)
Licensed Surveyor , Leveller
Land Commissioner
[illegible]
[illegible]
Telephone No. 035 2278728
[illegible] No. 19991017

Plan No :2013/P/99




Reserved for Road
[illegible] Pradeseeya Sabha

Reference:-

Scale :- 1:1000

PLAN

Shown The Road, From Naranpitiya - Evunugalle Pradeseeya Sabha Road
up to Udahawaththe Named "Samagi Mawatha"
situated at Kawudugama Village , in Mawatha Pattu
in 53 A Kawudugama GS Division in
Divisional Secretariet Division of Kegalle
within the Pradeseeya Sabha Limits of Kegalle
Paranakuru Korale Kegalle District
SABARAGAMUWA PROVINCE

| | | |
|---|---|---|
| Length of the Road | [illegible] M | 330 ft. |
| Width of Road | [illegible] M | 10 ft. |

Bounded as described above

07-510

## කෑගල්ල ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(3) ආ වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

1989 අංක 12 දරන (අනුෂාංගික විධිවිධාන) පනතේ දෙවන වගන්තිය සමඟ කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) ආ වගන්තිය ප්‍රකාරව කටයුතු කරමින් 24(1) ආ වගන්තිය ප්‍රකාරව 2014.03.27 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ ගැසට් පත්‍රයේ IV (ආ) කොටසෙහි ප්‍රකාශයට පත් කරන ලද පහත සඳහන් උපලේඛනයේ සඳහන් මාර්ග කෑගල්ල ප්‍රාදේශීය සභාව සතු මාර්ග ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.


එස්. ඒ. එස්. එම්. වික්‍රමසූරිය,
ලේකම්,
කෑගල්ල ප්‍රාදේශීය සභාව.
බුළුරුප්ප, හෙට්ටිමුල්ල.

පාරේ නම : ඌරඋල්ල වත්ත මාර්ගය
වසම : 53 ඒ කවුඩුගම
දිග : මීටර් 166
පළල : අඩි 08

| අනු. අංකය | පාරේ වම් පස | අනු. අංකය | පාරේ දකුණු පස |
|---|---|---|---|
| 1 | යූ. ජී. ජයරත්න, මඩුගහමුලතැන්න | 1 | ජානකීරත්න කුමාරි මඩුගහමුලතැන්න |
| 2 | ලතා වෛද්‍යරත්න ,මැදවත්ත හේන | 2 | ලතා වෛද්‍යරත්න මැදවත්ත හේන |
| | | 3 | බී. ආර්. තිලකාවතී පිටකොටුව |
| | | 4 | යූ. ජී. ලාලිත පිටකොටුව |
| | | 5 | එන්. ගාමිණී ගුණසිංහ ඌරඋල්ල වත්ත |

ආර්.ඩී. ධර්මසේන
ලියාපදිංචි බලයලත් මිනින්දෝරු
සහ තලම්තිකරු
7/7, උසාවිය පාර,
කෑගල්ල.
ලි.ප. අංකය- 19891716
දු.අංකය 071-8142729

පිඹුරු අංකය 415




විස්තරය

| | |
|---|---|
| කොක | කොන්ක්‍රීට් කණුව |
| ක | මායිම් කණුව |
| ඉ | ඉවුර |
| ගබැ | ගල් බැම්ම |
| කපැවැ | කම්බි පැළඹුණ වැට |
| ආතා | ආධාරක තාප්පය |
| අවි | අවිනිශ්චිත |
| අපා | අඩි පාර |
| මාර්ග(ප්‍රාස) | මාර්ගය(මාර්ග ප්‍රාදේශීය සභා) |

සත්‍ය පිටපතකි.

පරිමාණය 1: 1000

.......................................
ලේකම්
කෑගල්ල ප්‍රාදේශීය සභාව

## සබරගමුව පළාතේ

## කෑගල්ල දිස්ත්‍රික්කයේ පරණකුරු කෝරළයේ මාවත පත්තුවේ කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අංක 52 B ඌරාඋල්ල ග්‍රාම නිළධාරී කොට්ඨාශය තුළ ඌරාඋල්ල ගමේ පිහිටි "ඌරාඋල්ල වත්ත පාර" අඩි අටක්(8) පළලට සහ මීටර් 166 ක් දිගට මැන දැක්වෙන පිඹුර

## පිඹුර

| කැබලි අංකය | බිම් ප්‍රමාණය | | | |
|---|---|---|---|---|
| | අ. | රූ. | පර්. | හෙක්ටයාර් |
| 1 | 0 | 0 | 15.7 | 0.0398 |
| එකතුව | 0 | 0 | 15.7 | 0.0398 |

| | අ. | රූ. | පර්. | හෙක්ටාර් |
|---|---|---|---|---|
| සම්පූර්ණ බිම් ප්‍රමාණය | 0 | 0 | 15.7 | 0.0398 |

ආර්.ඩී. ධර්මසේන
ලියාපදිංචි මිනින්දෝරු
7/7, උසාවිය පාර,
කෑගල්ල.

කැඩිම ගා)
ඇඳීම කළේ 2012.12.20

07-511

# අතුරු ව්‍යවස්ථා

## කළුතර ප්‍රාදේශීය සභාව

### ත්‍රීරෝද රථ නවතා තැබීමේ අතුරු ව්‍යවස්ථාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 (VII) වැනි උප වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 122 වැනි වගන්තියේ විධි විධාන අනුව කළුතර ප්‍රාදේශීය සභාව විසින් සාදන ලදුව සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1725/16 සහ 2011 සැප්තැම්බර් මස 29 දිනැති අති විශෙෂ *ගැසට් පත්‍රය* මඟින් ප්‍රකාශිත කළුතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ත්‍රීරෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1760 සහ 2014 මැයි මස 25 දිනැති *ගැසට් පත්‍රය* මඟින් ප්‍රකාශිත ත්‍රී රෝද රථ නවතා තැබීමේ ස්ථාන සහ නවතා තැබීමට හැකි උපරිම ත්‍රී රෝද රථ, සංඛ්‍යාව ඇතුලත් උපලේඛනයට පහත සඳහන් ස්ථාන ඇතුලත් විය යුතු බවට පහත අනු අංක 01, 2015.05.14 දිනැති මහ සභා තීරණ අංක 7.2.1 හා පහත අනු අංක 2, 2015.06.08 දිනැති ලේකම් සහ සභාවේ බලතල කාර්ය කර්තවය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී අනුමැතිය යටතේ කළුතර ප්‍රාදේශීය සභාව විසින් අනුමත කර ඇති බව මෙයින් නිවේදනය කරමි.

ඉන්ද්‍රා ද සිල්වා,
ලේකම් සහ සභාවේ බලතල කාර්ය කර්තවය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
කළුතර ප්‍රාදේශීය සභාව.

2015 ජුනි මස,
කළුතර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

*උපලේඛනය*

| *අනු. අංකය* | *නවතා තබන ස්ථාන* | *එකවර නවතා තැබිය හැකි රථ සංඛ්‍යාව* |
|---|---|---|
| 01 | කුඩා වස්කඩුව පොකුණවත්ත ඉදිරිපිට (සමඟිපුරට හැරෙන තැන) ත්‍රී රෝද රථ ගාල | 03 |
| 02 | සිට්‍රස් හෝටලය අසළ ත්‍රී රෝද රථ ගාල | 03 |

07-564